කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 - ඔක්තෝබර්

**BCOME 2063 - විගණනය**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි ) 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. විගණකයාට මූල්‍ය ප්‍රකාශන වල සත්‍ය හා සාධාරණ බව සම්බන්ධයෙන් 100%ක තහවුරු කිරීමක් කළ නොහැක. ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද ? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. විගණනයක් කරගෙන යෑම සඳහා විගණකයකු තුළ පැවැතියයුතු ආචාරධර්ම 5 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

02. අ. විගණන භාරගැනීමේ ලිපියක ( Audit Engagement Letter) අන්තර්ගත දෑ විස්තර කරන්න.

(ලකුණු 10)

ආ. ගණුදෙනු හා ශේෂ මට්ටමේදී සාවද්‍ය ප්‍රකාශන පැවතිමේ අවදානම හා අනාවරණ අවදානම අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතී. පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

03. අ. අවදානම් තක්සේරු කිරීම සඳහා විගණකට ගතහැකි ක්‍රියාපටිපාටි (Risk Assessment Procedure ) 3 ක් විස්තරාත්මකව විදහා දක්වන්න.

(ලකුණු 10)

ආ. අභ්‍යන්තර පාලන පද්ධතියක ඇති සීමාවන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

04. අ. ප්‍රමාණාත්මක භාවය (Materiality) යනු කුමක්ද ? එය තීරණය කිරීමේදී අයිතමයක විශාලත්වය මෙන්ම එහි ස්වභාවය ගැනද අවදානය යොමුකළයුත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. මූල්‍ය ප්‍රකාශන සඳහා සමස්ථයක් ලෙස ප්‍රමාණාත්මක භාවය තීරණය කිරීමේදී භාවිතා කළ හැකි විවිධ මිනුම් දඬු මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

05. අ. මූල්‍ය ප්‍රකාශන වල පැවතිය හැකි සාවද්‍ය ප්‍රකාශන අචේතනිකව සිදුවන වැරදි හේතුකොටගෙන මෙන්ම සචේතිනිකව සිදුකරන ලද වංචා හේතුකොටගෙනද සිදුවිය හැක. මෙම ප්‍රකාශනය උදාරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. විගණනයක් සිදුකිරීමේදී විගණකයා සතුව ආයතනය හා එහි පරිසරය පිළිබඳව මනා අවබෝධයක් පැවතිය යුතුය. මෙම ප්‍රකාශයෙහි ආයතනය හා පරිසරය යන්නට අන්තර්ගත දෑ විස්තර කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

06. පහත දෑ කෙටියෙන් පැහැදිලි කරන්න.

අ. පාලන අවදානම (Control risk)

ආ. වෘත්තිය විචක්ෂණශීලී භාවය (Professional Skepticism)

ඇ. මානසික ස්වාධීන භාවය ( Independence in mind) හා දෘශ්‍යමාන ස්වාධීන භාවය (Independence in appearance)

ඉ. විගණකයකු සතුවිය යුතු සමස්ථ අරමුණ (Overall objectives of the auditor)

(ලකුණු 05 බැගින්)
(මුළු ලකුණු 20)